**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක :-01/2000**

මගේ අංකය :- ආVIII/04/ශ්‍රී.ලං.තා.සේ.
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2000.01.10

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් ලේකම් වරුන්.

**1977.05.01දින සිට 1994.06.30 කාලය තුළ ක්‍රියාත්මක වූ මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේ III පන්තියේ සහ II පන්තියේ සේවක සංඛ්‍යාව ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් සේ සලකා ක්‍රියා කිරීම.**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව 1994.07.01 දින සිට ක්‍රියාත්මක වීමට පෙර 1977.05.01 දින සිට ක්‍රියාත්මක වූ මධ්‍යම මට්ටමේ කාර්මික සේවා ව්‍යවස්ථා අනුව මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේ II පන්තියේ "ආ'' බණ්ඩය සඳහා අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩු නොමැති වීම හේතුවෙන් සියළුම සුදුසුකම් සපුරා තිබුනේ වුවත් එවකට සිටි එම සේවයේ නිලධාරීන්ට උසස්වීම් ලැබීම සඳහා ඉතා දිගු කලක් III වන පන්තියේ රැඳී සිටීමට සිදුවිය.

02. එසේ උසස්වීම් අවස්ථා අහිමි වූ මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේ සිටි නිලධාරීන්ට 1977.05.01 සිට ක්‍රියාත්මක වූ මධ්‍යම මට්ටමේ කාර්මික සේවාවේ III පන්තියේ සහII පන්තියේ "ආ'' බණ්ඩය අතර වූ සේවක සංඛ්‍යා අනුපාතය ඉවත් කිරීමට රජය තීරණය කොට ඇත. ඒ අනුව 1977.05.01 සිට 1994.06.30 දක්වා කාල සීමාව තුළ ආයතන අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් සේවක සංඛ්‍යා අනුපාතය නොසලකා සුදුසුකම් ලබන නිලධාරීන්ට හිඟ වැටුප් රහිතව උසස්වීම් ලබා දීමට කටයුතු කළ යුතුය.

03. මධ්‍යම මට්ටමේ කාර්මික සේවය සම්බන්ධයෙන් 1994.07.01 දින දක්වා ක්‍රියාත්මක වූ රාජ්‍ය පරිපාලන සහ ආයතන චක්‍රලේඛවල වූ විධිවිධානයන් මෙම සංශෝධනය අනුව ක්‍රියාත්මක කළ යුතුය.

04. මෙම විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී බලපෑම් ඇති වන රාජ්‍ය නිලධාරීන් කණ්ඩායම් තුනකි.

I. 1994.07.01 දිනට පෙර විශ්‍රාම ගිය මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේ නිලධාරීන්

II .1994.07.01දින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කිරීමෙන් පසුව 1999.12.24 දින දක්වා කාලය තුල විශ්‍රාම ගිය නිලධාරීන්

III. 1994.07.01 දින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කරන ලදුව, 1999.12.24 දින දක්වා රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්.

05. ඉහත අංක I හා II කාණ්ඩවල නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප අදාල පරිදි සංශෝධනය කළ යුතු අතර හිඟ වැටුප් ගෙවීමකින් තොරව 1999.12.24 දින සිට සංශෝධිත විශ්‍රාම වැටුප ගෙවිය යුතුය.

06. ඉහත අංක III කාණ්ඩයේ නිලධාරීන්ගේ වැටුප සංශෝධනය කර හිඟ වැටුප් ගෙවීමකින් තොරව 1999.12.24 දින සිට සංශෝධිත වැටුප ගෙවිය යුතුය.

07. මෙම උසස්වීම් හේතුවෙන් අදල නිලධාරීන්ට අතීතයට බලපාන පරිදි වෙනත් කිසිදු සේවා වරප්‍රසාදයකට හෝ අයිතිවාසිකමකට හිමිකම් නොලැබිය යුතුය.

08. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිවය.

(යූ.ජී.ජයසිංහ)
වැඩ බලන ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය